## විවිධත්ව (DV) වීසා

1995 මුදල් වර්ෂයේ සිට වාර්ෂික ලොතරැයියක් මගින් සංක්‍රමණ වීසා 55.000ක් ලබා දෙන විවිධත්ව වීසා වැඩසටහන 1990 සංක්‍රමණ පනත මගින් ස්ථාපිත කරන ලදී. පෙර වර්ෂ පහ තුළ එක්සත් ජනපදයට සංක්‍රමණිකයන් අඩු ප්‍රමාණයක් පැමිණ ඇති රටවලින් අයදුම්කරුවන් තෝරා ගැනීමෙන් එක්සත් ජනපදයේ සංක්‍රමණික ජනගහණය විවිධාංගීකරණය කිරීම මෙම ලොතරැයියේ අරමුණ වේ.

විවිධත්ව වීසාවක් සඳහා අයැදුම් කිරීමට usvisas.state.gov නම් වෙබ් අඩවියේ විවිධත්ව වීසා ක්‍රියාවලිය (Diversity Visa Process) යටතේ ඇති පියවර අනුගමනය කරන්න. මෙම පියවර සම්පූර්ණ කිරීමෙන් පසුව වැඩිදුර කටයුතු කිරීමට මෙම වෙබ් අඩවියේ දී ඇති තොරතුරු සමග කෙන්ටකි කොන්සියුලර් මධ්‍යස්ථානයෙන් (KCC) දී ඇති උපදෙස් අනුගමනය කරන්න.